# නිවේදනයයි

<u>**ඌව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති මොණරාගල/ තණමල්විල/බිබිල හා වැල්ලවාය කලාප අධ්‍යක්ෂ තනතුරු සඳහා අයදුම්පත් කැඳවීම - (2025)**</u>

ඌව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති මොණරාගල, තණමල්විල, බිබිල හා වැල්ලවාය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරු සඳහා සුදුසුකම් ලත් නිලධාරීන්ගෙන් දීප ව්‍යාප්තව අයදුම්පත් කැඳවනු ලැබේ.

<u>**සුදුසුකම් :-**</u>

1. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරියෙකු වීම
2. අයදුම්කරු අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට පූර්වාසන්න වසර 05 තුළදී කිසිදු විනයානුකූල දඬුවමකට යටත් නොවූ අයෙකු විය යුතු අතර, එම වසර 05 තුළදී සියලුම වැටුප් වර්ධක උපයාගෙන තිබිය යුතු වීම හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.
3. සෑම අයදුම්කරුවෙකුම තම තනතුරේ සේවය කිරිමට ප්‍රමාණවත් ශාරිරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත වීම.

<u>**සටහන :-**</u>

සුදුසුකම් සනාථ කෙරෙන සියලුම අධ්‍යාපන හා වෙනත් සහතිකවල සහතික කළ ඡායා පිටපත්, ජාතික හැඳුනුම්පතේ හා උප්පැන්න සහතිකයේ ඡායා පිටපත් අයදුම්පත සමඟ අමුණා එවිය යුතුය.

<u>**බඳවා ගැනිමේ ක්‍රමය:-**</u>

මෙම නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සපුරා ඇති අධ්‍යාපන පරිපාලන සේවයේ 1 ශ්‍රේණියට අයත් අයදුම්කරුවන් අතරින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයා ඉහත පුරප්පාඩුව සඳහා බඳවා ගනු ලැබේ

<u>**අයදුම්පත් ඉදිරිපත් කිරිම :-**</u>

අයදුම්කරුවන් විසින් මේ සමඟ ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙල කර ගත් ජීව දත්ත තොරතුරු ඇතුලත් නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් ආයතන ප්‍රධානීන්‘ හා දෙපාර්තමේන්තු ප්‍රධානීයා මඟින්, අයදුම්කළ යුතු වේ. අයදුම්කරන තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකි බවට නිර්දේශය ද සමඟ **2025.07.21** වන දින හෝ එදිනට පෙර, **"ඌව පළාත් අධ්‍යාපන ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය, ඌව පළාත් සභාව, බදුල්ල"** යන ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුය.

**(සැ.යු. : ලියුම් කවරයේ වම්පස ඉහළ කෙලවරේ "කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරු සඳහා බඳවා ගැනිම 2025" යනුවෙන් සඳහන් කරන්න)**

නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත්, අසම්පූර්ණ අයදුම්පත් හා අයදුම්පත් කැඳවීමේ දිනට සුදුසුකම් සම්පූර්ණ කර නොමැති අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.අයදුම්පත් ප්‍රමාද වීම හෝ නැතිවීම සම්බන්ධයෙන් කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ. මෙම පුරප්පාඩුව සම්පූර්ණ කිරිම හෝ නොකිරිම හෝ මෙම බඳවා ගැනිම සම්බන්ධයෙන් මෙහි විධිවිධාන සලසා නොමැති කරුණු සම්බන්ධයෙන් තීරණ ගැනිමේ අයිතිය ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමා සතුවේ.මේ පිළිබඳව විස්තර කාර්යාල වේලාව තුළ දුරකථන අංක **055-2230963** ඇමතීමෙන් ලබා ගත හැකි වේ.

මෙම බඳවා ගැනිම් හා අයදුම්පත් ඉදිරිපත් කිරිම සම්බන්ධ විස්තර **edumin.up.gov.lk** දරණ වෙබ් අඩවියෙන් ලබා ගත හැක.

- **2025.01.10 දින මා විසින් නිකුත් කරන ලද නිවේදනය මෙයින් අවලංගු කරනු ලැබේ.**

**2025. 06. 16 දින**

**නිහාල් ගුණරත්න**
**ඌව පළාත් අධ්‍යාපන ලේකම්**

**<u>ඌව පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩුව පවතින මොණරාගල/ තණමල්විල/ බිබිල/ වැල්ලවාය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරු සඳහා සුදුසුකම් ලත් නිලධාරින්ගෙන් අයදුම්පත් කැඳවීම - (2025)</u>**

**අයදුම් කරන තනතුර :-** ..........................................................................................................

1. සම්පූර්ණ නම :- ..........................................................................................................
2. මුලකුරු සමඟ නම :- ..........................................................................................................
3. රාජකාරි ලිපිනය :- ..........................................................................................................
4. පෞද්ගලික ලිපිනය :- ..........................................................................................................
5. උපන්දිනය :- .................................. 2025.07.21 දිනට වසය :- ......................
6. ස්ත්‍රී/පුරුෂ භාවය :- ..........................................................................................................
7. ජාතික හැඳුනුම්පත් අංකය :- ..........................................................................................................
8. දුරකථන අංකය :-

   රාජකාරි :- .......................................... පෞද්ගලික :- .................................
9. මුල් පත්වීම් දිනය :- ..........................................................................................................
10. සේවය ස්ථිර කල දිනය :- ..........................................................................................................
11. II ශ්‍රේණියට උසස් කළ දිනය:- ..........................................................................................................
12. I ශ්‍රේණියට උසස් කළ දිනය :- ..........................................................................................................
13. දැනට දරණ තනතුර හා ඊට පත්වූ දිනය :- ..........................................................................................................
14. පශ්චාත් උපාධි/පශ්චාත් උපාධි ඩිප්ලෝමා පිළිබඳ තොරතුරු :-

| ලබා ඇති පශ්චාත් උපාධි/ පශ්චාත් උපාධි ඩිප්ලෝමා | | ලබාගත් ආයතන | කාල සීමාව | සුදුසුකම් සපුරා ඇති දිනය |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

15. පූර්වාසන්න වසර 05ක වාර්ෂික කාර්ය සාධනය අනුව අවසාන ඇගයීම

| වර්ෂය | අවසාන ඇගයීම<br>විශිෂ්ඨයි/සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහලයි/ සතුටු දායකයි/ අසතුටුදායකයි |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |

16. රාජ්‍ය සේවයේ මුල් පත්වීමේ සිට 2025.07.21 දින දක්වා සේවා කාලයට අදාල තොරතුරු :-

| අනු අංකය | දරණ ලද තනතුර | අයත් සේවාව | ආයතනය | කාලය | |
|---|---|---|---|---|---|
| | | | | සිට | දක්වා |
| | | | | | |
| | | | | | |
| | | | | | |

17. පළාත් අධ්‍යක්ෂ, නියෝජ්‍ය අධ්‍යක්ෂ, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ හා කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරුවල වැඩ බැලීම හෝ රාජකාරි ඉටු කිරීම පිළිබඳ විස්තර :-

| අනු අංකය | දරණ ලද තනතුර | ආයතනය | කාලය | |
|---|---|---|---|---|
| | | | සිට | දක්වා |
| | | | | |
| | | | | |
| | | | | |

18. ලබා ඇති වැටුප් රහිත නිවාඩු පිළිබඳ විස්තර :-

.....................................................................................................................................................

.....................................................................................................................................................

19. විශේෂ සුදුසුකම් :-

.....................................................................................................................................................

.....................................................................................................................................................

.....................................................................................................................................................

20. වෙනත් තොරතුරු :-

.....................................................................................................................................................

.....................................................................................................................................................

.....................................................................................................................................................

.....................................................................................................................................................

21. ලබා ඇති දේශීය හා විදේශිය පුහුණු පිළිබඳ තොරතුරු :-

| ලබා ඇති දේශීය හා විදේශිය පුහුණු පාඨමාලා | ලබාගත් ආයතන | කාල සීමාව |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |

මෙම අයදුම්පතේ මා විසින් සපයා ඇති සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි.

දිනය :- .................................

............................................

අයදුම්කරුගේ අත්සන

**<u>ආයතන ප්‍රධානියාගේ නිර්දේශය</u>**

.................................................................... මහතා/ මහත්මිය/ මෙනවිය සම්බන්ධයෙන් විනය පරීක්ෂණයක් පැවැත්වෙන බව/ නොපැවැත්වෙන බව දන්වන අතර, ඔහු/ඇය විසින් සඳහන් කර ඇති තොරතුරු පෞද්ගලික ලිපි ගොණුව අනුව නිවැරදි බව සහතික කරමි. මෙම නිලධාරියා ඉල්ලුම් කර ඇති තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් දැනට සිටින සේවා ස්ථානයෙන් අනුප්‍රාප්තිකයෙකු සහිතව/ රහිතව මුදා හැරීමට එකඟ වෙමි./නොවෙමි.

දිනය :- .............................                ....................................................................

අත්සන හා නිල මුද්‍රාව

**<u>දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය :-</u>**

ආයතන ප්‍රධානියාගේ නිර්දේශයට එකඟ වෙමි/ නොවෙමි.

දිනය :- .............................                ....................................................................

අත්සන හා නිල මුද්‍රාව

**<u>අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය :-</u>**

ආයතන ප්‍රධානියාගේ හා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශයට එකඟ වෙමි/ නොවෙමි.

දිනය :- .............................                ....................................................................

අත්සන හා නිල මුද්‍රාව

**<u>ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව යටතේ පවතින මොණරාගල / තණමල්විල/ බිබිල/ වැල්ලවාය/ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරු සඳහා පත් කිරීම - සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දීමේ නිර්නායක</u>**

| <u>මාතෘකාව</u> | <u>උපරිම ලකුණු</u> |
|---|---|
| **01. ජ්‍යෙෂ්ඨතාවය**<br>ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 1 ශ්‍රේණියට උසස් වීමෙන් පසු එක් වසරකට ලකුණු 03 බැගින් (උපරිම වසර 10ක් දක්වා)<br>(ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 1ශ්‍රේණියට උසස් වීමෙන් පසු මාස 06 හෝ මාස 06ට වැඩි, වසරට වඩා අඩු - ලකුණු 0.5 බැගින්) | 30 |
| **02.ක්ෂේත්‍රයේ /ක්ෂේත්‍රවල පළපුරුද්ද**<br>2.1 අධ්‍යාපන සංවර්ධනය සඳහා සිදු කරන ලද ව්‍යාපෘති එකකට ලකුණු 01බැගින් ව්‍යාපෘති 05ක් සඳහා උපරිම ලකුණු 05 (මෙම ව්‍යාපෘති විධිමත් අනුමැතියක් සහිතව නිලධාරියා සෘජු දායකත්වයක් දක්වා ඇති ව්‍යාපෘති විය යුතු අතරම ව්‍යාපෘති වාර්තාව සහ කාළ රාමුව ඇතුලත් විය යුතුය)<br>**2.2සේවා පළපුරුද්ද**<br>I. අධ්‍යාපන පරිපාලන සේවයට පත්වීමෙන් අනතුරුව විදුහල්පති/ නියෝජ්‍ය විදුහල්පතිවරයෙකු වශයෙන් වසර 01ක් සඳහා ලකුණු 01 බැගින් උපරිම වසර 04ක් සඳහා - ලකුණු 04<br>II. අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ, නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ, කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරයෙකු වශයෙන් අවම වසර 01ක සේවා කාලයක් සඳහා වසරකට 01 බැගින් උපරිම - ලකුණු 08 (පහත පරිදි හිමිවේ)<br>• අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වසර 01 ක් සඳහා - ලකුණු 02 බැගින් (උපරිම වසර 02)<br>• නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/ කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ වසර 01ක් සඳහා } ලකුණු 01 බැගින් (උපරිම වසර 04)<br>III. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ, අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ, නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ,කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ, කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරේ වැඩ බැලීම හෝ රාජකාරි ඉටු කිරීම සඳහා වසර 01ක සේවා කාලයක් සඳහා උපරිම - ලකුණු 03 | 20 |
| **03.වෘත්තිය සුදුසුකම්/ පර්යේෂණ නවෝත්පාදන (3.1,3.2,3.3 හා 3.4 සඳහා ඉහළම සුදුසු සඳහා පමණක් ලකුණු දෙනු ලැබේ)**<br>**3.1** අධ්‍යාපන ක්ෂේත්‍රය පිළිබඳ පශ්චාත් උපාධි සුදුසුකම්<br>(අදාළ සේවා ව්‍යවස්ථාවේ/ බඳවා ගැනීම් පටිපාටියෙහි විශේෂයෙන් දක්වා ඇති ක්ෂේත්‍ර/ විෂයයන් අතරින් අදාළ ක්ෂේත්‍රය තෝරන්න)<br>a) පර්යේෂණයක් සහිත පශ්චාත් උපාධිය - ලකුණු 05<br>b) පශ්චාත් උපාධිය (පර්යේෂණ රහිත) - ලකුණු 04<br>c) පශ්චාත් උපාධි ඩිප්ලෝමාව - ලකුණු 03<br>d) උපාධි - ලකුණු 02<br>**3.2 පර්යේෂණ හා නවෝත්පාදන**<br>a) ජාත්‍යාන්තර වශයෙන් පිළිගත් අධ්‍යාපනික සඟරාවක පළ වූ අදාළ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ලියවුණු පර්යේෂණ නිබන්ධන - ලකුණු 05<br>b) පිළිගත් අධ්‍යාපනික සඟරාවක පළවූ අදාළ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ලියැවුනු පර්යේෂණ නිබන්ධන - ලකුණු 03<br>c) වැඩ වපසරිය තුළ සාර්ථකව ක්‍රියාත්මක කරන ලද නව්‍යාකරණ/ තොරතුරු තාක්ෂණික සැලසුම් සංවර්ධනය - ලකුණු 02 (ලේඛන සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි)<br>**3.3** අධ්‍යාපන පරිපාලන ක්ෂේත්‍රය තුළ පුහුණුව<br>(මෙම පුහුණුව අධ්‍යාපන කළමනාකරණය පිළිබඳ විෂයානුබද්ධ පුහුණුවක් විය | 22 |

| | |
|---|---|
| යුතුය, අදාළ නිලධාරියාගේ පත්වීම හා රාජකාරියට අදාළ විය යුතුය, එම පුහුණුව පළාත් හෝ ජාතික මට්ටමේ රජය විසින් පිළිගත් ආයතනයකින් ලබා තිබිය යුතුය)<br>a) මාස 03ක හෝ ඊට වැඩි කාලයක - ලකුණු 04<br>b) දින 10ත් මාස 03ත් අතර කාලයක - ලකුණු 02<br>c) දින 03ත් දින 10ත් අතර කාලයක - ලකුණු 01<br><br>**3.4 ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය** (a හා b අතුරින් ඉහළම සුදුසුකම සඳහා ලකුණු ලබා දේ)<br>a) පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ රජයේ පුහුණු ආයතනයකින් ලබා ගත් ඉංග්‍රීසි භාෂා ඩිප්ලෝමාවක් - ලකුණු 05<br>b) පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ රජයේ පුහුණු ආයතනයකින් ලබා ගත් ඉංග්‍රීසි භාෂා සහතික පත්‍ර පාඨමාලාව - ලකුණු 03<br>• (මෙය අතිරේක සුදුසුකමක් ලෙස සලකා බලන අතර, මුල් පත්වීම ලබා ගැනීම සඳහා ලබා ගත් සුදුසුකමක් නොවිය යුතුය)<br>c) ඉංග්‍රීසි භාෂා කථන හැකියාව - ලකුණු 03 | |
| **4. කාර්යසාධන ඇගයුම හා තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාවය**<br>**4.1 කාර්යසාධන ඇගයුම (පූර්වාසන්න වසර 05 සඳහා)**<br>(a) කාර්ය සාධන ඇගයුම සතුටුදායක - ලකුණු 0.5 බැගින්<br>(b) කාර්යය සාධන ඇගයුම සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහළ හෝ ඊට වැඩි - ලකුණු 01බැගින්<br>(c) කාර්ය සාධන ඇගයුම විශිෂ්ඨ - ලකුණු 02 බැගින්<br>**4.2 තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාවය**<br>මෙම පුහුණුව පළාත් හෝ ජාතික මට්ටමේ රජය විසින් පිළිගත් ආයතනයකින් සපුරා තිබිය යුතුයි. (ඉහලම සුදුසුකම සඳහා ලකුණු පිරිනැමේ)<br>a) තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමාවක් - ලකුණු 03<br>b) තොරතුරු තාක්ෂණ සහතික පත්‍ර පාඨමාලාව - ලකුණු 02 | 13 |
| **4. චර්යාත්මක නිපුණතා**<br>අයදුම්කරු විසින් දැනට සේවය කරනු ලබන සේවා ස්ථානයට අදාළව ආයතනයේ අරමුණු සාක්ෂාත් කිරීමට බලාපොරොත්තුවන සංවර්ධන වැඩ පිළිවෙල ඉදිරිපත් කිරීමට දෘඪ පිටපතක් ඉදිරිපත් කළ යුතු අතර, තම ප්‍රායෝගික අත්දැකීම් ද ඇසුරු කර ගනිමින් විනාඩි 05ක වාචික ඉදිරිපත් කිරීමක් Power Point Presentation ඇසුරෙන් සිදු කළ යුතුයි. ඒ සඳහා පහත සඳහන් කරුණු යටතේ ලකුණු ලබා දෙනු ලැබේ.<br>I. කාල කළමනාකරණය - ලකුණු 2<br>II. සන්නිවේදන කුසලතාවය - ලකුණු 2<br>III. අන්තර්ගතය (ආයතනයේ අරමුණු, යෝජනා) - ලකුණු 4<br>IV. සමස්ථ ඉදිරිපත් කිරීම - ලකුණු 4<br>V. පෞරුෂත්වය - ලකුණු 3 | 15 |

සටහන 1 - ඉහත ලකුණු පටිපාටියේ "පිළිගත් විශ්ව විද්‍යාලයක්" ලෙස දක්වා ඇත්තේ ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලැබ ඇති විශ්ව විද්‍යාලයකි.

සටහන 2 - ඉහත ලකුණු දීමේ පටිපාටියේ සඳහන් කර ඇති සියළු පශ්චාත් උපාධි සුදුසුකම් ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිශන් සභාව විසින් පිළිගනු ලැබූ විශ්ව විද්‍යාලයකින් ලබාගත් ඒවා විය යුතු අතර, උපාධි ප්‍රදානය කරන වෙනත් ආයතනවලින් ලබාගත් එවැනි සුදුසුකම් වේ නම් ඉහත කොමිෂන් සභාවේ පිළිගැනීම ලද ඒවා විය යුතුය.

**දිනය :- ...............................**